ජාතික ක්‍රීඩා අරමුදල - 2010

------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ජාතික ක්‍රීඩා අරමුදල 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ජාතික ක්‍රීඩා අරමුදලේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම්

----------------------------------------

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ආයෝජන ආදායම රු.41,214 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) පිළියන්දල පිහිටි ක්‍රීඩා පිටියක් සංවර්ධනය කිරීම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන් රු.6,500,000 ක් ප්‍රදානය කර තිබුණි. මෙම මුදල් කඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් අයකර ගත යුතුව තිබුණි. කෙසේ වුවද එම මුදල ලැබිය යුතු ශේෂයක් ලෙස පෙන්නුම් කරනු වෙනුවට වියදම් වශයෙන් ලියාහැර තිබුණි.

(ඇ) අරමදල වෙනුවෙන් ක්‍රීඩා අමාත්‍යාංශයට "ටාජ් ටීවී" ආයතනයෙන් රු.1,268,290 ක මුදලක් පසුගිය වසර තුළ ලැබී තිබුණු නමුත් අමාත්‍යාංශය විසින් එය අරමුදලට මාරු කර නොතිබුණි.

1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

ගිණුම් වල වූ පහත දැක්වෙන විෂයයන් එම එක් එක් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| | | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|---|
| | | ---------- | ----------- | ---------------------- |
| | | | රු. | |
| (අ) | වියදම් | | | |
| | (i) | මැලේසියාවේ පැවති විශේෂ පුහුණු පාඨමාලාවේ වියදම් සඳහා ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමයට | 406,000 | මුදල් භාරගත් බවට සනාථ කිරීම් |
| | (ii) | වාර්ෂික මැරතන් තරඟය සඳහා හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් වෙත | 50,000 | - එම- |
| | (iii) | දෙහිවල ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය - පාසලේ බාස්කට්බෝල් ක්‍රීඩා පිරියේ නවීකරණ කටයුතු සඳහා | 175,000 | - එම- |
| | (iv) | ශ්‍රී ලංකා ටෙනිස් සංගමය - විදේශීය පුහුණුකරුගේ වැටුප් සඳහා | 1,000,000 | ගිවිසුම |
| | (v) | තාරුණ්‍යයට හෙටක් - ටීඑම්ටීවී නාලිකාව මඟින් මෙහෙයවනු ලබන වැඩ සටහනක් විකාශය කිරීම සඳහා | 500,000 | මුදල් ලැබුණු බවට සනාථ කිරීම් |
| (ආ) | ගුවන් ගමන් ගාස්තු | | 1,299,260 | අදාල රටින් ලැබුණ ආරාධනා පත්‍රය |

**1.2.3 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

-------------------------------------------------------------------------

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25 (2) වගන්තිය අනුව එක් එක් ලිත් වර්ෂය ඉකුත් වූ පසු හැකිතාක් ඉක්මනින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශයේ ලේකම් විසින් පිළියෙල කළ යුතු වුවත් එවැනි වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

1.2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනදෙනු

-----------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පවත්වනු ලබන සුපිරි වාසනා ලොතරැයියෙන් ලැබිය යුතු ආදායම රු.51,065,440 කි. රු.4,541,350 ක් සඳහා කාල විශ්ලේෂණයක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. ජාතික ලොතරැයි මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල් භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා තිබුණද එම මුදල් ක්‍රීඩා අරමුදලට ලැබී නොතිබුණි.

(ආ) විදේශ සංචාරයක් සඳහා ක්‍රීඩා ඇමතිවරයා වෙනුවෙන් රු.1,300,000 ක පිරිවැයකට ගුවන් ටිකට්පත් 2 ක් මිලදී ගෙන තිබුණි. සංචාරය ක්‍රීඩා කටයුතු වල උන්නතිය සඳහා වන බවට සංචාරයේ අදාලත්වය සාධාරණීකරණය කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු පැහැදිළි කිරීම් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) අයවැය ප්‍රතිපාදන වල ඇතුලත් වී නොතිබුණ රු.මිලියන 10 ක් සහ රු.මිලියන 35 ක් පිළිවෙලින් පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළලේ කටයුතු සඳහා ජාතික ඔලිම්පික් කමිටුවට සහ දියගම ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා ලබාද තිබුණි. මෙම ගනදෙනු වලින් ලගාකරගත් ප්‍රගතිය පිළිබඳ විස්තර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.27,045,187 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය වූ රු.68,113,817 හා සැසදීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.41,068,630 ක අඩුවීමක් පෙන්නුම් කෙරුණි. ආදායම රු.මිලියන 26 කින් වැඩිවීම සහ වියදම් රු.මිලියන 67 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

2.2 මෙහෙයුම් සමාලෝචනය

--------------------------

2.2.1 කාර්ය සාධනය

----------------

ශ්‍රී ලංකාවේ ක්‍රීඩා වලට ධෛර්යයදීම, ඒවා දියුණු කිරීම හා සංවර්ධනය කිරීම අරමුදලෙ ප්‍රධාන අරමුණු වුවත් ඒ සඳහා සංයුක්ත සැලැස්මක් හෝ වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. විදේශ සංචාර, ක්‍රීඩා උපකරණ මිළදී ගැනීම, ක්‍රීඩා ඇඳුම් මිළදී ගැනීම සහ වෛද්‍ය බිල් පියවා ගැනීම ආදි කටයුතු සඳහා යම් ක්‍රීඩා සමාජයක් හෝ ක්‍රීඩකයෙක් , ක්‍රීඩිකාවක් හෝ විසින් ඉල්ලුම් කරන යම් මුදලක් ලබාදීම පමණක් දැනට අරමුදලෙ ක්‍රියාකාරකම් වලට සමාවී ඇති බව නිරීක්ෂණය විය.

## 2.2.2 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

අයවැය සහ තථ්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. එබැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණු බැව් නිරීක්ෂණය විය.

## 3. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු අමාත්‍යාංශයේ ලේකම්ගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන කෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ලැබිය යුතු ශේෂ

(ආ) අයවැය

(ඇ) අරමුදල් උපයෝජනය